තනතුරු ඇබෑර්තු

මහනුවර මහා නගර සභාව

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර හා සුභසාධන දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත උඩරට නර්තන උපදේශක සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ උඩරට නර්ත පුහුණු ව්‍යාපෘතියේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත උඩරට නර්තන උපදේශක කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර **2026.11.13** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

උඩරට නතර්න උපදේශක සේවය

1. මිලදී ගැනීමට නියමිත සේවාව : ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත නර්තන උපදේශක සේවය සපයා ගැනීම

2. මාසික දීමනාව : පුහුණුව ලබාදෙන පැයක් සඳහා රු. 500 බැගින් සඳුදා සිට සිකුරාදා දක්වා දිනකට පැය 03 බැගින්

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ භාෂාව සහ නර්තන විෂය යන විෂයයන් 02 සඳහා සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත් ව තිබිය යුතුය.

5. වෘත්තීය සුදුසුකම් : තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් නර්තනය සම්බන්ධයෙන් වසරක් හෝ ඊට වැඩි කාල සීමාවක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

6. පළපුරුද්ද : යටත් පිරිසෙයින් ක්ෂේත්‍රයේ අවුරුදු 02 ක් වත් පළපුරුද්ද ලබා තිබීම

7. වෙනත් සුදුසුකම් :
   අ. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
   ආ. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
   ඇ. බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
   ඈ. කාන්තා අයදුම්කරුවන් පමණක් අයදුම් කළ යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයකු පහත කොන්දේසිවලට යටත් ව සේවයට තෝරාගනු ලැබේ:-

   - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගැනීමට අපේක්ෂිත තනතුරු සංඛ්‍යාව 01 කි.
   - මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන අතර, අදාළ සුදුසුකම් සපිරූ අයදුම්පත්‍ර නොමැතිනම් අනෙකුත් ප්‍රදේශවල අයදුම්පත්‍ර සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.
   - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සේවා සපයා ගැනීම සඳහා යොදවා ගනු ලැබේ.

9. සේවා කොන්දේසි :

- සේවය සපයා ගැනීමේ කාලය, සේවාව ලබා ගැනීම ආරම්භ කරන දින සිට මාස 06කි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.
- අවශ්‍ය ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ බලය නාගරික කොමසාරිස් සතු වේ.
- තෝරාගත් අයවලුන් යම් අවස්ථාවක සේවයෙන් ඉවත් වේ නම් මාසයකට පෙර දැනුම් දීමක් සිදු කළ යුතුය.
- මෙම සේවයේ යොදවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
- තෝරාගන්නා අයදුම්කරු මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සමග සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

සටහන : මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරී අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 ඔක්තෝබර් මස 30 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර හා සුභසාධන දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත උඩරට නර්තන උපදේශක සේවය ලබා ගැනීම

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය: .....

02. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : .....

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : .....

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): .....

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. උපන්දිනය :- වර්ෂය : .....මාසය: ..... දිනය: .....

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.11.13 දිනට) වයස: අවුරුදු.....මාස..... දින.....

06. ස්ත්‍රී පුරුෂ භාවය : .....

07. විවාහක / අවිවාහක භාවය : .....

08. ස්ථිර ලිපිනය : .....

09. දුරකථන අංකය : .....

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : .....

එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව:.....

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (I) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය : .....
විභාග අංකය : .....

අනු. අංකය	*විෂයය*	*ලබා ඇති ශ්‍රේණිය*
01		
02		
03		
04		
05		
06		
07		
08		
09		
10		

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

වර්ෂය : .....
විභාග අංකය : .....

අනු. අංකය	*විෂයය*	*ලබා ඇති ශ්‍රේණිය*
01		
02		
03		
04		

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :

වෘත්තීය සුදුසුකම් :
.....
. .....
.....
.....

පළපුරුද්ද :
.....
. .....
.....
.....

13. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

.....,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....

10-823